**ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරී කණ්ඩායම සිය සංචාරය අවසන් කරයි**

2020 පෙබරවාරි 08 දින

සාමාජික රටක සංචාරය අවසන් කිරීමෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) දූත මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන මූලික නිරීක්ෂණ, එම දූත මණ්ඩල සංචාර අවසානයේ නිකුත් කෙරෙන පුවත් පත් නිවේදන තුළ අන්තර්ගත වේ. මෙම ප්‍රකාශනයෙහි ඇති අදහස් ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායමේ අදහස් වන අතර, එමගින් ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ මතය අත්‍යාවශ්‍යයෙන්ම පිළිබිඹු නොවේ. මෙම දූත මෙහෙය ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡාවලට බඳුන් නොවේ.

- පසුගිය අප්‍රේල් මාසයේදී සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරවලින් අනතුරුව ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වෙමින් පවතින අතර, 2020 වසරේදී ආර්ථිකය සියයට 3.7 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

- ප්‍රතිපත්ති මනාව පෙළ ගැස්වීම, තරගකාරිත්වය ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාවේ සර්ව සහභාගීත්වයක් සහිත වර්ධනයට දායකත්වයක් සැපයීම අරමුණු කරගත් ව්‍යුහාත්මක හා ආයතනික ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

- ඉහළ ණය මට්ටම් සහ ප්‍රතිමූල්‍යන අවශ්‍යතා හමුවේ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ වෙළඳපොළ විශ්වාසය පවත්වා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය විචක්ෂණශීලීත්වය තීරණාත්මක වේ.

නව රජයේ ප්‍රධානීන් හමුවීම සහ එහි ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මැනුඑලා ගොරෙති (Manuela Goretti) මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුතු ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායමක් 2020 ජනවාරි 29 - පෙබරවාරි 07 කාලය තුළදී කොළඹට පැමිණි අතර, සිය සංචාරය අවසානයේ ගොරෙති මහත්මිය විසින් පහත ප්‍රකාශය සිදු කරන ලදී.

“මෑතකාලීන ආර්ථික ප්‍රවණතා සහ රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය පිළිබඳව ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායම සහ ශ්‍රී ලංකා බලධාරීන් අතර ඵලදායී සාකච්ඡාවන් පැවැත්වුණි. රටෙහි ඉහළ රාජ්‍ය ණය මට්ටම සහ ප්‍රතිමූල්‍යන අවශ්‍යතා හමුවේ සාර්ව ආර්ථික ස්ථායීතාව සහතික කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තිය සහ ජාත්‍යන්තර සංචිත ගොඩනැංවීම සඳහා වන තිරසාර ප්‍රයත්නයන් අවශ්‍ය වේ. රටෙහි වර්ධන විභවතාවය සහ සර්ව සහභාගීත්වය

ප්‍රවර්ධනය කිරීම ඉහළ නැංවීම අරමුණු කරගත් ව්‍යුහාත්මක සහ ආයතනික ප්‍රතිසංස්කරණ ඉතා තීරණාත්මක වේ.

"පසුගිය අප්‍රේල් මාසයේ සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් අනතුරුව ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. 2019 වසරේදී මූර්ත ද.දේ.නි.යේ වර්ධනය සියයට 2.6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. නිෂ්පාදන අංශයේ සිදු වූ ශක්තිමත් වර්ධනය සහ වසරේ දෙවන භාගයේ දී සංචාරක හා ඒ ආශ්‍රිත සේවාවන් යථා තත්ත්වයට පත්වීම මේ සඳහා හේතු විය. නිතර නිතර යාවත්කාලීන වන දර්ශක තවදුරටත් වැඩිදියුණු වූ අතර, සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වනු ඇතැයිද නව කොරෝනා වෛරසය මගින් සංචාරක පැමිණීම් සහ අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් සිදු නොවනු ඇතැයි ද යන උපකල්පන මත 2020 වසරේදී ආර්ථික වර්ධනය සියයට 3.7 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉලක්කයට අනුව උද්ධමනය සියයට 4.5 ක පමණ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2019 වසරේ දී ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ වැටීමෙන් අනතුරුව, 2020 වසරේ දී ජංගම ගිණුමේ හිඟය, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 3 කට ආසන්න වන පරිදි පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

"මූලික දත්ත මගින් පෙන්නුම් කෙරෙන පරිදි, දුර්වල ආදායම් කාර්යසාධනය සහ වියදම් එහි ඇස්තමේන්තු ඉක්මවා යාම හේතුවෙන් විස්තීර්ණ ණය පහසුකම යටතේ ඉලක්කයක් වූ ප්‍රාථමික ශේෂයේ අතිරික්තය 2019 වසරේදී සැලකිය යුතු ප්‍රමාණයකින් මගහැරී ඇති අතර, එය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.3 ක හිඟයක් ලෙස වාර්තා වේ. සංචාරය අතරතුර දී බලධාරීන් සමඟ පවත්වන ලද සාකච්ඡාවලට අනුව වර්තමාන ප්‍රතිපත්ති යටතේ, අලුතින් ක්‍රියාත්මක කරන ලද බදු අඩු කිරීම් සහ නිදහස් කිරීම්, දේශීය වශයෙන් පවත්නා හිඟ මුදල් පියවීම සහ 2019 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ප්‍රාග්ධන වියදම් වැඩිවීම හේතුවෙන් 2020 වසරේ ප්‍රාථමික ශේෂයේ හිඟය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.9 ක් දක්වා පුළුල් විය හැකිය. ණය තිරසාරභාවය සඳහා ඇති විය හැකි අවදානම් සහ මැදිකාලීනව පවතින විශාල ප්‍රතිමූල්‍යයන අවශ්‍යතා හමුවේ සාර්ව ආර්ථික ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කඩිනම් කිරීම සඳහා වන ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වනු ඇත. තීරණාත්මක සමාජ හා ආයෝජන අවශ්‍යතා සඳහා අවකාශය සලසා ගන්නා අතරතුර රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ආදායම් එක්රැස් කිරීම ශක්තිමත් කිරීමට පියවර ගැනීම ඉහළ රාජ්‍ය ණය ප්‍රමාණය අඩු කරගැනීමට උපකාරී විය හැකිය. රාජ්‍ය මූල්‍ය නීති ශක්තිමත් කිරීම සඳහා අදාළ නීති සම්පාදනය කඩිනම් කිරීම තුළින් ප්‍රතිපත්ති මනාව ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීම, විශ්වාසය ප්‍රතිස්ථාපනය කිරීම සහ මැදිකාලීනව තිරසාරභාවය පවත්වා ගෙන යෑම තහවුරු වනු ඇත.

"ශ්‍රී ලංකා මහ බැංකුව විචක්ෂණශීලී හා දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් අනුගමනය කළ යුතු අතර, ක්‍රමිකව දියුණු වන සාර්ව ආර්ථික තත්ත්වයන්ට අනුකූල වන පරිදි වෙනස් කිරීමට සූදානම්ව සිටිය යුතුය. ජනාධිපතිවරණයෙන් පසුව සහ බදු පහත හෙළීමක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වෙළඳපොළ පීඩනය හමුවේ විස්තීර්ණ ණය පහසුකම තුළින් සහාය දක්වන වැඩසටහන යටතේ 2019 වසරේ දෙසැම්බර් අවසානය සඳහා වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය ළඟා කර ගත නොහැකි වූ අතර,එම පරතරය එ.ජ. ඩොලර් මිලියන 100 ක් පමණ විය. කෙසේ වුවත්, එතැන් සිට වෙළඳපොළ තත්ත්වයන් ස්ථාවර විය. නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම සඳහා සංචිත ආරක්ෂණ නැවත ගොඩනැඟීම සඳහා උත්සාහ ගැනීම අවශ්‍ය

වේ. අන්තර්ජාතික ප්‍රශස්ථ භාවිතයන්ට අනුකූලව නව මහ බැංකු පනත අනුමත කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය සහ පාලනය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය අත්කර ගැනීමට සහාය වීම සඳහා තීරණාත්මක පියවරකි.

"විශේෂයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ යම් අවදානම් සහගත තත්ත්වයන් වරින්වර පැවතුණද සමස්තයක් වශයෙන් මූල්‍ය පද්ධතිය ස්ථාවරව පවතී. මූල්‍ය අතරමැදි කටයුතුවල අනපේක්ෂිත වෙනස් වීම් සහ අකාර්යක්ෂමතාවයන් වළක්වා ගනු වස් ණය අනුපාතිකයන් මත පනවා ඇති උපරිම සීමාවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ලබා දී ඇති ණය ආපසු ගෙවීමේ සහනයන් ආදී පියවරයන් තාවකාලික විය යුතුය. තැන්පතු ලබා ගන්නා මූල්‍ය ආයතන හා සම්බන්ධ නියාමනය, අධීක්ෂණය සහ නිරාකරණ රාමු ශක්තිමත් කිරීම හා අනුකූල කිරීමේ අරමුණින් බැංකු පනත නවීකරණය කිරීම මූල්‍ය ස්ථායිතාව ආරක්ෂා කිරීමට උපකාරී වේ.

"ශ්‍රී ලංකාවේ ආර්ථික ශක්‍යතාවයන් මුළුමනින්ම ප්‍රයෝජනයට ගැනීමටත් සමාජ සහභාගීත්වය වැඩි දියුණු කිරීමටත්, වර්ධනය ඉහළ නංවන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමඟ බලධාරීන් ඉදිරියට යා යුතුය. රජය සතු වාණිජ ව්‍යවසායයන් ශක්තිමත් වාණිජ පදනමක් මත ක්‍රියාත්මක වීමට ඉඩ සලසමින් ඒවායෙහි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වන රජයේ සැලසුම්, දූත කණ්ඩායමේ පිළිගැනීමට ලක් විය. විශේෂයෙන්ම බලශක්ති අංශයේ පාලනය සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම සඳහා වූ පැහැදිලි කැපවීමක් සහ දූෂණය මැඩපැවැත්වීම සඳහා වූ නව ප්‍රයත්නයන් තුළින් මෙම සැලසුම් සඳහා සහය ලැබිය යුතුය. ව්‍යාපාරික වාතාවරණය වැඩිදියුණු කිරීම, වෙළඳාම සඳහා ඇති විවෘතභාවය සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ දේශගුණික විපර්යාසයන් ගෙන් එල්ල වන අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව තිරසාර යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා දැඩි ප්‍රයත්නයන් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව, ඉහළ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය, සමාජ ආරක්ෂණය වැඩිදියුණු කිරීම සහ අධ්‍යාපනය හා කුසලතා සඳහා තවදුරටත් ආයෝජනය කිරීම තුළින් වාසි ලබා ගනු ඇත".

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්, භාණ්ඩාගාර ලේකම් එස්.ආර්. ආටිගල, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති පී.එන්. වීරසිංහ යන මහත්වරුන් මෙන්ම වෙනත් රාජ්‍ය නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රජාව, සිවිල් සමාජයේ සහ ජාත්‍යන්තර ආයතනයන්හි නියෝජිතයන් ද හමු විය.

## ශ්‍රී ලංකාව : තෝරාගත් ආර්ථික දර්ශක

| | 2016 | 2017 | 2018 | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|---|---|
| | | | | විස්තීර්ණ ණය පහසුකමෙහි 6 වන සමාලෝචනය | ඇස්තමේන්තුගත | විස්තීර්ණ ණය පහසුකමෙහි 6 වන සමාලෝචනය | පුරෝ. |
| **නිමැවුම** | | | | | | | |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි. යේ) වර්ධනය (%) | 4.5 | 3.4 | 3.2 | 2.7 | 2.6 | 3.5 | 3.7 |
| **මිල** | | | | | | | |
| උද්ධමනය (සාමාන්‍යය, %) 1/ | 4.0 | 6.6 | 4.3 | 4.4 | 4.3 | 4.8 | 4.8 |
| **මධ්‍යම රජයේ මූල්‍ය** | | | | | | | |
| ආදායම සහ ප්‍රදාන (ද.දේ.නි.යේ % ලෙස) | 14.1 | 13.7 | 13.4 | 12.8 | 12.2 | 13.9 | 11.3 |
| වියදම (ද.දේ.නි.යේ % ලෙස) | 19.5 | 19.2 | 18.6 | 18.6 | 18.4 | 19.2 | 19.2 |
| ප්‍රාථමික ශේෂය (ද.දේ.නි.යේ % ලෙස) | -0.2 | 0.0 | 0.6 | 0.2 | -0.3 | 0.7 | -1.9 |
| සමස්ත ශේෂය (ද.දේ.නි.යේ % ලෙස) | -5.3 | -5.5 | -5.3 | -5.7 | -6.2 | -5.3 | -7.9 |
| මධ්‍යම රජයේ ණය (ද.දේ.නි.යේ % ලෙස) | 79.0 | 77.4 | 83.3 | 83.2 | 84.2 | 82.4 | 84.6 |
| රාජ්‍ය ණය (ද.දේ.නි.යේ % ලෙස) 2/ | 84.1 | 82.7 | 90.0 | 89.9 | 91.0 | 89.2 | 91.4 |
| **මුදල් සහ ණය** | | | | | | | |
| පුළුල් මුදල් (% වෙනස) | 18.4 | 16.7 | 13.0 | 7.0 | 7.0 | 10.6 | 10.3 |
| පෞද්ගලික අංශය වෙත වූ ණය (% වෙනස) | 21.6 | 14.7 | 15.9 | 5.7 | 4.5 | 10.7 | 10.1 |
| **ගෙවුම් තුලනය** | | | | | | | |
| ජංගම ගිණුම (ද.දේ.නි.යේ % ලෙස) | -2.1 | -2.6 | -3.2 | -2.6 | -2.5 | -2.8 | -2.9 |
| විදේශීය සෘජු ආයෝජන (ද.දේ.නි.යේ % ලෙස) | 0.8 | 1.5 | 1.7 | 1.7 | 1.4 | 1.7 | 1.4 |
| සංචිත (එ.ජ. ඩොලර් මිලියන) | 6019 | 7959 | 6919 | 8168 | 7642 | 9120 | 8190 |
| සංචිත (ආනයනික මාස) | 2.8 | 3.6 | 3.4 | 3.6 | 3.4 | 3.8 | 3.4 |
| විදේශීය ණය (ද.දේ.නි.යේ % ලෙස) | 56.3 | 57.5 | 58.8 | 63.8 | 63.9 | 62.3 | 62.1 |

මූලයන්: ශ්‍රී ලාංකික බලධාරීන් ලබාදුන් දත්ත සහ ජා.මූ.අරමුදලේ නිලධාරීන්ගේ ඇස්තමේන්තු

1/ කොළඹ පාරිභෝගික මිල දර්ශකය

2/ මධ්‍යම රජයේ ණය, රජය ඇප වූ ණය, සහ ජා.මූ. අරමුදල සමඟ නොපියවා ඉතිරිව ඇති ණයවලින් සමන්විත වේ. 2019 වසර සඳහා ඇති මූලික දත්තවල ව්‍යාපෘති වියදම් සඳහා අනුමත වූ විදේශීය මූල්‍යන ණය මුදල් මුදා හැරීම් අන්තර්ගත වන අතර, ඒවා 2020 වසර තුළ වාර්තා ගත කර ඇත.